# කාර්යසාධන වාර්තාව

# 2013

# රාජ්‍ය ව්‍යාපාර දෙපාර්මේන්තුව

# දැක්ම

## ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහතික කරනු ලබන ප්‍රධානතම ආයතනය බවට පත්වීම

# මෙහෙවර

**රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය උපරිමත්වයට පත්කිරීම සඳහා, විශිෂ්ඨ පරිචයන් භාවිතා කරමින් යහපත් අභිලාෂයන් සුරක්ෂිත කරනු පිණිස රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය ශක්තිමත් කිරීම**

## පටුන

1. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ............ 1

1.1 සමාලෝචනය ............ 1

2) 2013 වර්ෂය තුල රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉටු කල ප්‍රධාන කාර්යයන් ............ 1

3) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත් වන රාජ්‍ය ව්‍යවසායයන්හි භෞතික කාර්ය සාධනය ............ 5

3.1 මහා භාණ්ඩාගාරයට ගෙවන අයභාර හා ලාභාංශ ............ 5

3.2 රාජ්‍ය ව්‍යවසායයන්හි සේවා නියුක්තිය ............ 5

3.3 රාජ්‍ය ව්‍යවසායයන් සඳහා අයවැය සහන ............ 5

3.4 ක්‍රමෝපායන් වශයෙන් වැදගත්වන රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය තත්වය ............ 6

4. රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ දායකත්වය ............ 6

4.1 රාජ්‍ය ව්‍යවසායයන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ගත් ක්‍රියාමාර්ග හා නිර්දේශයන් ............ 6

5. දෙපාර්තමේන්තුවේ මානව සම්පත ............ 16

6. මූල්‍ය කළමනාකරණය ............ 19

ඇමුණුම I: 2013 වර්ෂය තුලදී දෙපාර්තමේන්තුව විසින් සහභාගි වූ කෝප් රැස්වීම් ............ 20

ඇමුණුම II: රාජ්‍ය ව්‍යවසායයන්හි වාර්ෂික ඉදිරිපත් කිරීම ............ 21

√ * : කෙටුම්පත් √ + : මූල්‍ය වාර්තා සපයා ඇත. ............ 23

ඇමුණුම III: රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් ලද අයභාර/ලාභාංශ ආදායම ............ 24

රු.මිලියන ............ 24

ඇමුණුම IV: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අධීක්ෂණයට යටත් රාජ්‍ය ව්‍යවසායයන් සඳහා අයවැය ප්‍රතිපාදන ලබා දීම ............ 25

ඇමුණුම V : රාජ්‍ය ව්‍යවසායයන් 55ට අදාළව 2013.12.31 දිනට වූ මූල්‍ය තත්ත්වය ( 2014 සඳහා පුරෝකතන සහිතව) ............ 26

## 1. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය

### 1.1 සමාලෝචනය

රජය සතු ව්‍යවසායයන්හි කාර්ය සාධනය නිරීක්ෂණය සඳහාත්, 1971, අංක 38 දරණ මුදල් පනතේ II කොටසෙහි පරිපාලනයටත් (රාජ්‍ය සංස්ථාවන්හි මූල්‍ය පාලනය) ඒකාබද්ධ/සංස්ථාපිත යහපාලනය මඟින් රාජ්‍ය ව්‍යාවසායන්හි කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීමටත් 2002 වසරේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව නැවත පිහිටුවන ලදී. දැනට ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායයන් 250ක් පමණ ඇති අතර ඉන් සියයට 55 ක් පමණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත් වන අතර ඉතිරි සියයට 45 ප්‍රමාණය රාජ්‍ය අයවැය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන බැවින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත්වන රාජ්‍ය ව්‍යාවසායන්ගෙන් වාණිජ ක්‍රියාකාරකම්හි නිරත වන ආයතන 55ක් රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් ලෙස හඳුනාගෙන ඇත.එම රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්ගේ වත්කම් 2012 දී රු.බිලියන 4,515 සිට 2013 දෙසැම්බර් 31 වන විට රු.බිලියන 5,182 දක්වා සියයට 14.8 කින් වර්ධනය කරගෙන ඇත. මෙම රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් 55 සතු සම්පූර්ණ වත්කම් පදනමින් සියයට 89.4ක් එනම් බිලියන 4,633කට ද පසුගිය වසරේ වත්කම් වර්ධනයෙන් සියයට 86ක් සඳහාද දායකත්වය දරා ඇත්තේ උපාය මාර්ගික වශයෙන් වැදගත් ප්‍රධාන ව්‍යාපාර 10 වන ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම, ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය, ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවයි.

## 2) 2013 වර්ෂය තුල රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉටු කල ප්‍රධාන කාර්යයන්

අ) චක්‍රලේඛ නිකුත් කිරීම

රාජ්‍ය ව්‍යවසායයන්ගේ යහපාලනය හා මූල්‍ය විනය තහවුරු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අඛණ්ඩව රාජ්‍ය ව්‍යවසායයන්හි මෙහෙයුම් හා මූල්‍ය කළමණාකරණයට අදාලව මාර්ගෝපදේශ සංවර්ධනය කිරීමේ හා නිකුත් කිරීමේ කටයුතු වල නිරත විය. 2013 වසර තුළදී දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යවසායයන් සම්බන්ධයෙන් චක්‍රලේඛ තුනක් නිකුත් කරන ලදී.

i. 2013 ජනවාරි 15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 01/2013 මගින් රාජ්‍ය ව්‍යවසායයන්හි සේවකයන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස සේවකයින්ගේ කැමැත්ත හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කිරීම.

ii. සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, පාරිතෝෂික ගෙවීම් සහ බදු ගෙවිය යුතු සේවකයින්ගේ වැටුපෙන් අය කරන ලද උපයනවිට ගෙවීම් බදු කෙලින්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යැවීම ආදී අනිවාර්ය ව්‍යවස්ථාපිත ගෙවීම් විධිමත් කිරීමට අදාලව 2013.09.11 දිනැති රාජ්‍ය ව්‍යපාර චක්‍රලේඛ අංක පීඊඩී 02/2013 නිකුත් කිරීම.

iii. ජාත්‍යන්තරව පිළිගත් පරිචයන්ට අනුකූලව රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය, මූල්‍ය විශ්ලේෂණය, සැලසුම් කිරීම හා කළමණාකරණය ඉහළ නැංවීම සඳහා 2013.10.02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 03/2013 මගින් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුගතවීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදී. මෙම ගිණුම්කරණ ප්‍රමිතීන් උපචිත පදනම මත ගිණුම්කරණ භාවිතා කරන සියලු ව්‍යවස්ථාපිත මණ්ඩල (වාණිජ නොවන සංස්ථා) සඳහා අදාල වේ.

ආ) පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා ක්‍රියාමාර්ග සඳහා සහය ලබා දීම

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුව් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (පො.ව්‍යා.කා.ස) විමර්ශන සඳහා, එක් එක් රාජ්‍ය ව්‍යවසායයන්හි කාරක සභා රැස්වීම් සඳහා ඒවායේ විස්තරාත්මක වාර්ථාවන් සපයමින් අනුග්‍රහය දක්වන ලදී. වැඩි දුරටත්, රාජ්‍ය ව්‍යවසායයන් සඳහා පො.ව්‍යා.කා.ස විසින් දෙන ලද උපදෙස් හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කර නැවත පො.ව්‍යා.කා.ස වෙත වාර්තා කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහභාගි වූ කෝප් රැස්වීමෙ ලැයිස්තුවක් ඇමුණුම I හි දක්වා ඇත.

ඇ) රාජ්‍ය ව්‍යවසායයන්හි වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳ පසුවිපරම් කළ අතර එහි වර්තමාන තත්ත්වය ඇමුණුම II හි දක්වා ඇත.

ඈ) රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ විගණකාධිපතිගේ වාර්ථාවන්හි විගණන සොයා ගැනීම් පිළිබඳ පසු විපරම් කිරීම සිදු කරන ලදී.

ඉ) රාජ්‍ය ව්‍යවසායයන්හි අතිවිශේෂ මහා සභා රැස්වීම්/කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි වූ අතර රජයේ ප්‍රතිපත්ති අනුව යමින් එම ව්‍යවසායයන්ගේ කාර්යය සාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා මාර්ගෝපදේශය ලබා දෙන ලදී.

ඊ) සියලුම රාජ්‍ය ව්‍යවසායයන්හි යහපාලනය පවත්වාගෙන යාමේ අරමුණින් සමාගම් පනතට යටත් වන රාජ්‍ය සමාගම් සඳහා විගණකාධිපතිගේ නිර්දේශ සහිතව බාහිර විගණන ආයතන පත් කිරීම සිදුකරනු ලබයි.

උ) මූල්‍ය පනත, මූල්‍ය රෙගුලාසි හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයන්ට අනුකූලව රාජ්‍ය ව්‍යවසායයන් විසින් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙන් ලබා ගත යුතු නිර්දේශ ලබා ගැනීම් සම්බන්ධීකරණ කටයුතු, අවශ්‍යතා පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. තවද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යවසායයන් මඟින් සිදු කරනු ලබන විවිධ ඉල්ලීම් පිළිබඳව විශ්ලේෂණ කර රජයේ ප්‍රතිපත්තීන්ට ඇති අනුකූලතාවය සැලකිල්ලට ගෙන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී. මේ යටතේ ප්‍රාග්ධන වියදම්, ණය සීමා වැඩිකර ගැනීම්, තීරු බදු සංශෝධන ආදීන් සඳහා අනුමැතිය ලබාදීම් ඇතුලත් වේ.

ඌ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සඳහා මාර්ගෝපදේශ හා චක්‍රලේඛ මඟින් ලබා දී ඇති අධිකාරී බලය උපයෝගි කර ගනිමින් රාජ්‍ය ව්‍යවසායයන් සඳහා වාහන මිලදී ගැනීම්, විදේශ සංචාර, අයවැය ප්‍රතිපාදන හා මුදල් නිදහස් කිරීම් යනාදිය සඳහා අනුමැතීන් ලබා දෙන ලදී.

එ) රාජ්‍ය ව්‍යවසායයන් සම්බන්ධයෙන් බලපවත්නා මාර්ගෝපදේශ හා නීති ප්‍රතිපාදන පිලිබඳ පැහැදිලි කිරීම් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අවශ්‍යතා පරිදි රාජ්‍ය ව්‍යවසායයන් වෙත ලබා දෙන ලදී.

ඒ) පනත් හා ආඥා පනත් සංශෝධන සඳහා නිරීක්ෂණ හා සාකච්ඡා සිදු කිරීමට පහසුකම් සලසා දෙන ලදී. කාර්ය සාධනය හා යහපාලනය වැඩිදියුණු කර ගැනීම සඳහා ලංකා බැංකු ආඥා පනත සංශෝධනය සිදු කරන ලදී.

ඔ) රාජ්‍ය ව්‍යවසායයන්හි ප්‍රගති සමාලෝචන, කාර්ය සාධනය හා මෙහෙයුම් ගැටළු විසඳීමට අදාල සාකච්ඡා සඳහා ඒවායේ අධ්‍යක්ෂ මණ්ඩල/ ඉහල කළමනාකාරීත්වය සමඟ භාණ්ඩාගාර ලේකම්තුමා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරු හෝ අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ ප්‍රධානත්වයෙන් රැස්වීම් ගණනාවක් සංවිධානය කරන ලදී.

ඕ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විෂය පතයට අයත් වන රාජ්‍ය ව්‍යවසායයන් සම්බන්ධයෙන් ඉදිරිපත් වන අමාත්‍ය මණ්ඩල සංදේශ අධ්‍යනය හා විශ්ලේෂණ සිදු කර ඒ සඳහා මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කල යුතු නිර්දේශ ඉදිරිපත් කිරීම් කරන ලද අතර ඒ පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

**වගුව 1 , රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ:**

| අංශය | අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ ප්‍රමාණය |
|---|---|
| බැංකු හා මූල්‍ය | 1 |
| රක්ෂණය | 1 |
| බලශක්තිය | 53 |
| වරාය | 4 |
| ගුවන් සේවා | 11 |
| මගී ප්‍රවාහනය | 6 |
| ඉදිකිරීම් | 12 |
| පශු සම්පත් | 8 |
| වැවිලි | 11 |
| පුනර්ජනනීය නොවන සම්පත් | 6 |
| සෞඛ්‍ය | 6 |
| මාධ්‍ය | 7 |
| වෙළෙඳපොළ හා බෙදාහැරීම් | 25 |
| එකතුව | **151** |

ක) ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ සාමූහික ගිවිසුම් සාකච්ඡා කිරීම සඳහා පත් කල කමිටුව වෙත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් උපදෙස් සපයන ලදී.

ග) රාජ්‍ය ව්‍යවසායයන් විසින් ලබා දිය යුතු අයභාර හා ලාභාංශ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙනුවෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලදී. තවද 2013 වසරේ ආදායම් ගිණුම රාජ්‍ය ව්‍යපාර දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.

ජ) රාජ්‍ය ආයෝජන ගිණුම සංසන්දනය කිරීමේ කටයුතු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2013 වසරේදී ආරම්භ කළ අතර ඊට අදාල තොරතුරු රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් හා ඒවායේ උප සමාගම් වලින් රැස් කරමින් පවති.

## 3) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත් වන රාජ්‍ය ව්‍යවසායයන්හි භෞතික කාර්ය සාධනය

### 3.1 මහා භාණ්ඩාගාරයට ගෙවන අයභාර හා ලාභාංශ

2013 වසරේදී රජය සතු ව්‍යවසායයන් 49 ක් මගින් රජයේ බදු නොවන ආදායම් ලෙස රු.බිලියන 35ක් ඒකාබද්ධ අරමුදලට බැර කොට ඇත. මෙහිදී ප්‍රධාන දායකයන් වන බැංකු හා මූල්‍ය, රක්ෂණ සහ ලොතරැයි අංශ මගින් පිළිවෙලින් රු.බිලියන 16, 05 හා 0.5 බැගින් ලබා දී ඇත. භාණ්ඩාගාරයට ලබා දුන් අයභාර/ලාභාංශ ප්‍රමාණයෙන් සියයට 67ක්ම රාජ්‍ය බැංකු විසින් ලබා දී ඇත. එසේ වුවත්, විශාල රාජ්‍ය ව්‍යවසායයන් වන ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ගුවන් තොටුපල ගුවන් සේවා සමාගම විසින් සිදු කරන මහා පරිමාණ ප්‍රාග්ධන ව්‍යාපෘති ආයෝජන හේතුවෙන්ද, ලංකා ඛනිජ තෙල් සමාගමේ හා ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සැළකිය යුතු ලෙස අලාභ ලැබීම හේතුවෙන්ද මෙම වසරේදී මහා භාණ්ඩාගාරය වෙත ලාභාංශ හා අයභාර ලැබී නොමැත. 2013 වසරේදී රජය වෙත අයභාර/ලාභාංශ ලැබීම් පිළිබඳ විස්තර වෙන් කිරීම අංක III ඇමුණුමෙහි දක්වා ඇත.

### 3.2 රාජ්‍ය ව්‍යවසායයන්හි සේවා නියුක්තිය

රජය සතු ව්‍යවසායයන්හි පුද්ගලයන් 256,189කින් පමණ සමන්විත වූ ශක්තිමත් ශ්‍රම බලකායක් සේවය කල අතර ඉන් 149,460 අත්‍යවශ්‍ය සේවා හා උපයෝගී සේවා සපයන රාජ්‍ය ව්‍යවසායයන් 55 තුල සේවයේ නිරත විය. 2012 වසර සමඟ සංසන්දනයේදී 2013 වසරේදී ශ්‍රම බලකාය සියයට 0.6 කින් වැඩි වී ඇත.

### 3.3 රාජ්‍ය ව්‍යවසායයන් සඳහා අයවැය සහන

2013 වසරේදී මහා භාණ්ඩාගාරය විසින් ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා ගුවන් හා ගුවන් සේවා සමාගම , ශ්‍රී ලංකන් ගුවන් සමාගම, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, ශ්‍රී ජයවර්ධනපුර රෝහල ද ඇතුලත්ව ප්‍රාග්ධනය හා පුනරාවර්තන වියදම් සඳහා එම ආයතන විසින් සිදුකරන ආර්ථික හා සමාජ වගකීම් සැළකිල්ලට ගෙන ඒවායේ වාණිජ නොවන ක්‍රියාකාරකම් වෙනුවෙන් වන්දි ගෙවීම් පිණිස, රු බිලියන 35ක් ප්‍රේෂණය කොට ඇත. රාජ්‍ය ව්‍යවසායයන් සඳහා ලබාදුන් අයවැය සහන ඇමුණුම IV දක්වා ඇත.

## 3.4 ක්‍රමෝපායන් වශයෙන් වැදගත්වන රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය තත්වය

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් කලින් කල රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය තොරතුරු එක්රැස් කර විශ්ලේෂණය කරන අතර එහි ප්‍රතිඵල අනුව අධ්‍යක්ෂ මණ්ඩල හා කළමනාකාරිත්වය සමඟ සමාලෝචන සාකච්ඡා පැවැත්වේ. ක්‍රමෝපායික වශයෙන් වැදගත්වන රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය තත්ත්වය ඇමුණුම V හි දක්වා ඇත.

## 4. රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ දායකත්වය

### 4.1 රාජ්‍ය ව්‍යවසායයන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ගත් ක්‍රියාමාර්ග හා නිර්දේශයන්

රාජ්‍ය ව්‍යවසායයන්හි කෙටිකාලීන හා මධ්‍ය කාලීන අරමුණු ලඟා කර ගැනීම සහතික කිරීම සඳහා පහත දැක්වෙන ප්‍රධාන නිර්දේශ යෝජනා කර ඇත.

| අංශය | රාජ්‍ය වානිජ ව්‍යවසායයන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග | නිර්දේශයන් |
|---|---|---|
| බලශක්තිය<br><br>ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | මහාභාණ්ඩාගාරය, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව හා රාජ්‍ය බැංකු සමඟ මාසික සාකච්ඡා වට පවත්වමින් රටේ බල ශක්ති අවශ්‍යතාව සපුරා ගැනීම සහ වෙළඳ ශේෂය නිසි අයුරින් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ලැබීය.<br>බොහොමයක් ඛණිජ තෙල් හා ආශ්‍රිත නිෂ්පාදනයන් සඳහා 2013 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක කරනු ලැබූ පිරිවැය පිළිබිඹුවන මිල ක්‍රමයත් සමඟ ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ රු. බිලියන 97ක් වූ විශාල අලාභය රු. බිලියන7ක් දක්වා අඩු කර ගැනීමට හැකි වූ අතර, එය එම වසර සඳහා පුරෝකතනය කර තිබූ රු.බිලියන 20ක අලාභයටද වඩා ඉතා අඩු මට්ටමකට පත් විය.<br>2014 අයවැය යෝජනාවන්හි සඳහන් පරිදි දීර්ඝ කාලයක් තිස්සේ ලංකා විදුලිබල මණ්ඩලය ඇතුළු අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු විසින් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව පියවිය යුතු රාජ්‍ය මුදල් නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් එකී ආයතනවල වගකීම් භාර ගනිමින් භාණ්ඩාගාර බැදුම්කර ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නිකුත් කිරීමට මූලික කටයුතු සිදු කරනු | විදුලි උත්පාදන සංයෝගය විවිධාංගීකරණය කිරීම තුලින් බලශක්ති සුරක්ෂිතාවය තහවුරු කිරීම.<br><br>පද්ධති අලාභයන් අඩුකිරීම තුලින් බලශක්ති කාර්යක්ෂමතාවය හා සංරක්ෂණය ඉහල නැංවීම.<br><br>තාක්ෂණය හා වැඩිදියුණු කල නිෂ්පාදන භාවිතයෙන් බෙදාහැරීමේ ක්‍රමවේදය නවීකරණය කිරීම<br><br>ඛනිජ තෙල් පිරිපහදුව නවීකරණය කිරීම හා පුළුල් කිරීම තුළින් බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කිරීම.<br>ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය පුළුල් කිරීම.<br><br>ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය<br><br>ඛනිජ තෙල් ගබඩා පහසුකම් ඉහළ නැංවීම, දැනට පවතින නල පද්ධතිය වැඩිදියුණු කිරීම ඉහළ නැංවීම.<br><br>වාර ගිවිසුම් යටතේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම තුළින් ආනයන පිරිවැය අඩුකර |

| | | |
|---|---|---|
| | ලැබීය. මේ මගින් 2013 වර්ෂය අවසානයේදී සංස්ථාවට ලැබිය යුතු වෙළඳ ණය ශේෂය වූ රු.බිලියන 101න් 45%ක් වූ රු. බිලියන 46ක් පියවා ගැනීමට සංස්ථාවට හැකි වූ අතර එමගින් ආයතනයේ ද්‍රවශීලතාවය වැඩිකර ගැනීමටත්, ශේෂ පත්‍රයේ ශුද්ධ වත්කම්හි අගය වැඩිකර ගැනීමටත් හැකි විය. තවද රාජ්‍ය ව්‍යවසායයන් සඳහා ණය උපරිමයන් හා කාලසීමාවන් තීරණය කිරීමට මහා භාණ්ඩාගාරය මූලිකත්වයගෙන කටයුතු කරනු ලැබීය.<br>විදුලි ගාස්තු සංශෝධනයේදී රජය පිරිවැය පිළිඹිබු වන මිල ක්‍රමයක් හඳුන්වා දීමට ගත් ප්‍රතිපත්තියම තීරණය හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය ඉහල නැංවින. මේ අනුව ලංකා විදුලිබල මණ්ඩලයට රු. බිලියන 18.5ක මෙහෙයුම් ලාභයක් වාර්තා කිරීමට 2013 වසරේදී හැකි විය. කෙසේ වෙතත් ප්‍රතිපත්තිමය තීරණ මත ඒකක 90ට අඩුවෙන් භාවිතා කරන පාරිභෝගිකයන්ට සහ කර්මාන්ත අංශයන්ට තව දුරටත් සහනාධාර ලබා දීමට කටයුතු කර ඇත.<br>විදුලි උත්පාදන සංයුති විවිධාංගීකරණයෙන් විදුලි උත්පාදන ධාරිතාව වැඩි දියුණු කිරීමටත්, වැඩිවන විදුලිබල ඉල්ලුම සපුරාලිය හැකි පරිදි සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම් මධ්‍යස්ථාන දියුණු කිරීමටත්, පද්ධති ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහාත් වර්ෂ ගණනාවක් මුළුල්ලේ රජය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට විදේශාධාර මගින් මෙන්ම අයවැය මගින්ද අරමුදල් ලබාදී ඇත. මේ අනුව මහා භාණ්ඩාගාරය විසින් ලංකා විදුලිබල මණ්ඩලය සඳහා රු. බිලියන 69ක් 2013 වසරේදී මූල්‍යාධාර සපයා ඇත. | ගැනීම. |
| ජලය<br><br>ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ජලය හා සනීපාරක්ෂක පහසුකම් සපයන ජාතික ආයතනය ලෙස ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මහින්ද චින්තන ප්‍රතිපත්තියෙන් හඳුනාගෙන ඇති නල ජලය ලබා දීම සඳහා අවශ්‍ය ආයෝජන රු.මිලියන 25,889ක් 2013 වසරේදී ලබා දී ඇත. පහත සඳහන් මහා පරිමාණ ව්‍යාපෘති මේ වසරේදී ආරම්භ කරන ලදී.<br>- කිලිනොච්චි ජල ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය ( ජයිකා)<br>- මහියංගන ජල සම්පාදන ව්‍යාපෘතිය(ඔස්ට්‍රියා)<br>- මහා රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය ( ස්පාඤ්ඤය)<br>- ලබුගම හා කලටුවාව ජල පවිත්‍රාගාර ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය<br>- අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (ජයිකා) | දිවයින පුරා ආදායම් නොලබන ජලය සැපයුම අඩුකරගැනීමේ ක්‍රමෝපායක් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.<br><br>ජල සම්පාදන සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන දිරි ගැන්වීම.<br><br>ප්‍රජා මූලික සංවිධාන මඟින් බෙදාහරින ජලයේ ගුණත්වය තහවුරු කිරීම.<br><br>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඉහළ බලශක්ති පිරිවැය අඩු කර ගැනීමට හා බලශක්ති කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමට හැකි වන අයුරින් සුදුසු තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම<br>කාර්යක්ෂම තොග කළමනාකරණ පිළිවෙතක් ක්‍රියාත්මක කිරීම.<br><br>වකුගඩු රෝග ආශ්‍රිත ගැටළු නිරාකරණය සඳහා ජාතික මට්ටමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම. |

| | | |
|---|---|---|
| | 2013 වසරේ වූ විදුලිබල ගාස්තු වැඩිවීම හේතුවෙන් ප්‍රධාන වශයෙන් විදුලිබල වියදම රු. මිලියන 3,356 දක්වා වැඩිවීම නිසා නිෂ්පාදන වියදම් 2012 වසරට සාපේක්ෂව 2013 සියයට 16 ඉහළ ගොස් ඇත.<br><br>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2012 දී ඇති කළ මිල සංශෝධනයේ යහපත් බලපෑම හේතුවෙන් 2012 දී ලාභයට වඩා සියයට 46 එනම් රු.මිලියන 1002 ලාභයක් 2013 වසරේදී ලබා ඇත.<br><br>ප්‍රාග්ධන වැය ප්‍රගති වාර්තාව ඇසුරින් ජල සම්පාදන හා ප්‍රජා මූල ජල සම්පාදන ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රගතිය පිළිබදව සමාලෝචනය කරන ලදී.<br><br>ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ව්‍යාපෘතින් සඳහා අවශ්‍ය ස්ථාපිත අරමුදල් ලබා ගැනීම පහසුකම් සැපයීමට එහි ගිණුම් ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.<br><br>රජයේ ප්‍රතිපත්තියට අනුව ජල ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා දේශිය බැංකු මඟින් සාකච්ඡා පැවැත්වෙමින් පවති. | මලාපවහන හා ජල සම්බන්ධතා ලබා ගැනීම සඳහා පාරිභෝගිකයින් පෙළඹවීමට වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම.<br><br>ව්‍යාපෘති ප්‍රමාදයන් හා පිරිවැය ඉක්මවීම් අවම කිරීමට හැකිවන අයුරින් වඩාත් සුදුසු ව්‍යාපෘති කළමනාකරණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීම. |
| මගී ප්‍රවාහනය<br><br>ශ්‍රී ලංකා<br>ගමනාගමන<br>මණ්ඩලය | 2013 වසරේදී මහාභාණ්ඩාගාරය මගින් ලබාදුන් රු. බිලියන 1 ක මුදල උපයෝගි කර ගනිමින් කුඩා බස් රථ 281ක් මිලදී ගනු ලැබීය. ඊට අමතරව, සුඛෝපභෝගී බස් රථ 13ක් හා දොර දෙකේ බස් රථ 03ක් කල් බදු ක්‍රමය යටතේ මිලට ගන්නා ලදි. එමෙන්ම 2014-2018 කාල පරිච්ඡේදය තුලදී කල් බදු ක්‍රමය යටතේ නව බස් රථ 2200ක් මිලට ගැනීම තුළින් බස් රථ ඇණිය සවිමත් කිරීම සඳහා රු. බිලියන 5ක මුදලක් සැපයුම් ‘ණය පදනම මත ලබා දීමට රජය සැලසුම් කර ඇත. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවකයින්ගේ නොපියවූ සියළුම සේවක අර්ථ සාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හා පාරිතෝෂික දීමනා ගෙවා දැමීමට කටයුතු කරන ලෙස නියෝග ලබා දී ඇත. | මනා කළමනාකරණ හා මානව සම්පත් කළමනාකරණ පද්ධතීන් ක්‍රියාත්මක කිරීම තුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීම.<br><br>ධාවන තත්ත්වයේ නැති බස් රථ ඉවත් කිරීම<br>මාසික දායකත්ව නිසි කලට සම්ප්‍රේෂණය කරමින් දැනට පවතින ව්‍යවස්ථාපිත ගෙවීම් විශේෂයෙන් සේවක අර්ථසාධක අරමුදල් හැකි ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කිරීම.<br><br>ඉන්ධන අකාර්යක්ෂමතා හා නාස්තිය අඩු කිරීම. |
| ගුවන් සේවා<br><br>ශ්‍රී ලංකන් ගුවන් සමාගම<br><br>මිහින් ලංකා ගුවන් සමාගම | රජය විසින් ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් ශ්‍රී ලන්කන් හා මිහින් ලංකා යන ගුවන් සමාගම් දෙක වෙත සපයා ඇත.<br><br>ද්‍රවශීලතා ගැටළු අවම කරමින් ශ්‍රී ලන්කන් ගුවන් සමාගමෙහි ගුවන්යානා නැවත සංචිතගත කිරීම හා කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සඳහා සම්මේලික ණය ලබා ගැනීමට මෙන්ම ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත.<br><br>පිරිවැය අවම කිරීමට ගතයුතු පියවරයන් මෙන්ම භාණ්ඩාගාර අරමුදල්,බැඳුම්කර හා | මෙහෙයුම්වල පිරිවැය කාර්යක්ෂමතාවය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම<br>ආදායම් ඉහළ නැංවීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම<br>දැනට ලබා දී ඇති අයවැය ප්‍රතිපාදන යොදාගෙන ගුවන් සමාගම් දෙකම ලාභ සමච්ඡේදන තත්ත්වයට පත්වීමට හා අයවැය මත නොයැපෙන ස්වාධීන තත්ත්වයකට පත් කිරීමට කටයුතු කල යුතුය.<br>මගී සුව පහසුව වැඩි දියුණු කිරීම හා ගුවන් යානා නැවත සංචිතගත කිරීම තුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහල නැංවිම<br>මඟීන් හා භාණ්ඩ ප්‍රවාහනයේ වැඩිවන ඉල්ලුමට |

| | | |
|---|---|---|
| | ණය මඟින් ලබා ගනු ලබන අරමුදල්ද යොදා ගනිමින් ලාභ සමච්ඡේදනය කිරීමට අවශ්‍ය මඟපෙන්වීම් ලබා දී ඇත.<br><br>ගුවන් සමාගම් දෙකම ස්වාධීන ආයතන බවට පත්වීම අරමුණුකොට ගනිමින් ව්‍යාපාරික සැලැස්ම සකස් කල යුතු බවට දන්වා ඇත. | සරිලන අයුරින් ශ්‍රී ලන්කන් හා මිහින් ලංකා ගුවන් සමාගම් එහි යානා සංචිතය වැඩි කිරීම.<br>ඉංජිනේරු නඩත්තු කටයුතු,අළුත්වැඩියා හා සමස්ත පහසුකම් සැපයීම සඳහා මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ප්‍රාදේශීය ඒකකයක් පිහිටුවීම<br>2016 වනවිට මඟී මෙහෙයුම් මිලියන 12 ක් දක්වා වැඩි කිරීමට හැකිවන අයුරින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ නවීකරණය කිරීම<br>ගුවන් තොටුපොළ දෙකෙහිම ගුවන් භාණ්ඩ මෙහෙයුම් ධාරිතාවය වැඩිදියුණු කිරීම<br>ගමනාන්තයෙන් ගමනාන්තයට ජාල සබඳතාවය පුළුල් කිරීම. |
| වරාය | මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සඳහා පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගැනීම හා කලාපයේ තරඟකරුවන් සමඟ තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා නව තීරු බදු හඳුන්වාදීමට පහසුකම් සපයන ලදී.<br><br>මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ ආයෝජන කලාපයේ බොරතෙල් ආශ්‍රිත නිෂ්පාදන,සීනි,සිමෙන්ති,ස්වාභාවික ද්‍රවවායු බලශක්ති හා පොහොර නිෂ්පාදන සඳහා විදේශ ආයෝජන ලබා ගැනීමට අදාල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.<br><br>වරාය සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා විදේශ මෙන්ම දේශීය ණය ලබා ගැනීමට පහසුකම් සපයන ලදී.<br><br>ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සුමට මිලදී ගැනීම් ක්‍රියාවලීන් සඳහා 2013 වසර සඳහා ප්‍රාග්ධන වියදම් දැරීම් සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා දෙන ලදී. | ඉහළ යන මූල්‍ය පිරිවැය ආවරණය කරගැනීම සඳහා මධ්‍යකාලීන ආදායම් ඉපැයීමේ ක්‍රියාකාරකම් පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය අවධානය යොමුකළ යුතුයි.<br><br>ධාරිතාවය පුළුල් කිරීම සහ නව තාක්ෂණය හඳුන්වාදීම තුලින් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම<br>පවතින පහසුකම් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම. |
| ඉදිකිරීම් | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව වෙනුවෙන් රුපියල් මිලියන 400 ක බැංකු අයිරා පහසුකමක් ලංකා බැංකුවෙන් ලබා ගැනීම සඳහා භාණ්ඩාගාර ඇපකරයක් නිකුත් කිරීමට කටයුතු කළ අතර එමගින් ඉහළ පොලී අනුපාතයන් යටතේ ලබා ගෙන තිබූ බැංකු අයිරා පහසුකම් පියවා ආයතනයේ මූල්‍ය පිරිවැය අවම කිරීම සඳහා පියවර ගෙන ඇත.<br><br>ඉදි කිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද රජය සතු ඉදිකිරීම් නියෝජිත ආයතනවල ප්‍රගතිය හා ඉදිරි ක්‍රියාමාර්ග සඳහා වන නිර්දේශ පිළිබඳ වාර්තාව සඳහා මහා භාණ්ඩාගාරයේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.<br><br>එමගින් මෙම ආයතන මගින් භාර ගනු ලබන ඉදි කිරීම් හා උපදේශක කාර්යයන් සඳහා සලකා බලන අවස්ථාවකදී තිබිය යුතු අතැති වැඩ ප්‍රමාණය මත පදනම්ව සීමාවන් පනවා | කාර්යක්ෂමතාව හා පෞද්ගලික අංශයේ සේවා සැපයුමට ඇති ධාරිතාවය ඉහල නැංවීම සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම.<br><br>ඉදිකිරීම් භාර ගැනීම ආයතනයේ ධාරිතාවයට පමණක් සීමා කිරීම.<br><br>කාලය හා පිරිවැය ඉක්මවීම වැලැක්වීම සඳහා කාර්යක්ෂම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලීන් යොදා ගැනීම<br>ව්‍යාපෘති භාර ගැනීමට පෙර ඒ සඳහා වන අයවැය ප්‍රතිපාදන තහවුරු කර ගැනීම |

| | | |
|---|---|---|
| | ඇති අතර එම සීමාවන් පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂණ කමිටුව මගින් වාර්ෂිකව පරීක්ෂා කර සංශෝධනය කරනු ලබයි.<br>මෙම දෙපාර්තමේන්තුවේ අඛණ්ඩව සුපරීක්ෂණය හා සිහි කැඳවීම් ලිපි යැවීමේ ප්‍රතිඵලයක් ලෙස ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව,රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යන ආයතනයන්හි 2010 දක්වා වු වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට හැකියාව ලැබිණි.අනෙකුත් වාර්ෂික වාර්තා ප්‍රමාද වීමකින් තොරව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් එම ආයතනවලට ලබා දී ඇත. | |
| රාජ්‍ය බැංකු | 2012.01.01 සිට 2014.12.31 දක්වා වන කාල සීමාවට අදාල ලංකා බැංකුව හා ලංකා බැංකු සේවක සංගමය සඳහා වු සාමුහික ගිවිසුමට අදාල වැටුප් නොවන ප්‍රතිලාභ අනුමත කරන ලදී.<br>ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ යහපාලනය වැඩිදියුණු කර ගැනීමේ අරමුණින් වයස අවුරුදු 60ට වැඩි සේවකයන්ගේ සේවා දිගු සලකා බැලීම් නොකරන ලෙසටත් පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවන ලෙසත් දැනුම් දෙන ලදී. ගෙවා නිම කල ප්‍රාග්ධනය වැඩිකර ගැනීම සඳහා මහජන බැංකුවේ පනත සංශෝධනයට පහසුකම් සපයන ලදී.<br>ගණකාධිකාරි හෝ විගණන අංශයේ පලපුරුද්ද හා සුදුසුකම් සහිත අධ්‍යක්ෂවරයෙක් සමඟ එහි අධ්‍යක්ෂ මණ්ඩලය 7 දක්වා වැඩි කිරීමට හැකි වන පරිදි ලංකා බැංකු ආඥා පනත වෙනස් කරන ලදී.<br>1996 පසු සේවයට බැඳුණු මහජන බැංකු හා ජාතික ඉතිරි කිරීමේ බැංකු සේවකයන්ට අදාල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීමට පහසුකම් සැපයූ අතර ලංකා බැංකුවට අදාලව විශ්‍රාම වැටුප් ස්ථාපිත කිරීමට සාකච්ඡා වට කීපයක් පවත්වන ලදී.<br>ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ සාමුහික ගිවිසුමට අදාළ සාකච්ඡා සඳහා පහසුකම් සපයන ලදී.<br>ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධනය වර්ධනය කර ගැනීමට අදාලව ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමඟ සාකච්ඡා කරන ලදී.<br>රාජ්‍ය බැංකු ඒකාබද්ධ කිරීමට අදාල සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් කැඳවන ලදී. | ආර්ථිකයේ නැඟී එන අංශයන් හඳුනාගනිමින් එම අංශ සඳහා ණය පහසුකම් සැලසීමට කර්මාන්තයේ සුවිශේෂී තැනක් හිමිවන අයුරින් තරඟකාරි මෙන්ම අඩු පොලී පරිසරයක් තුළ අදාළ ව්‍යාපාරික සැලසුම් වැඩිදියුණු කිරීම.<br>රටේ ඉතා දුරබැහැර ප්‍රදේශයන් වෙතද අන්තර්ජාල හා ජංගම දුරකථන භාවිතය ව්‍යාප්ත වී ඇති බැවින් පුද්ගලික අංශයේ බැංකු සමඟ තරඟ කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හැකියාවන් වර්ධනය කර ගැනීම. විශේෂිත බැංකු සිය මූල්‍ය පහසුකම් සහ ප්‍රමුඛතාවන් ක්ෂුද්‍ර මූල්‍ය , කුඩා හා මධ්‍ය පරිමාණඅංශ,කාන්තා ව්‍යවසාය, කෘෂිකර්මය යනාදී අංශ කෙරෙහි යොමුකළ යුතු අතර ක්ෂුද්‍ර මූල්‍ය ,කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්හි පාරිභෝගිකයින් බලාත්මක කිරීම හා ආර්ථික පිරමීඩයන්හි පහල ප්‍රමුඛතාවක් ඇති අංශ සඳහා ණය පහසුකම් සැපයීම සඳහා ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම.<br>ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සඳහා ඵලදායීව හා කාර්යක්ෂමව ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය ක්‍රමෝපායන් ක්‍රියාත්මක වන බවට සහතික වීම සඳහා සේවකයන්ගේ කුසලතා හා හැකියාවන් පුළුල් කිරීම.<br>නැවත ණය අයකර ගැනීමේ ක්‍රමයේ කාර්යක්ෂමතාවය හා ණය පහසුකම් වල ගුණත්වය වැඩි කිරීම |
| අලෙවිය හා බෙදාහැරීම් | **හොටෙල් ඩිවලොපර්ස් ලංකා පී.එල්.සී**<br>**(එච්.ඩී.එල්)**<br>එච්.ඩී.එල් සමාගම විසින් රජයට ගෙවිය යුතුව | විවිධ වියදම් තලයන්වලට අයත් දේශිය මෙන්ම විදේශිය සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා වන නම්‍යශීලී මිල පැකේජයන් හඳුන්වා දීම. |

| | | |
|---|---|---|
| | තිබූ ණය මුදලින් සියයට 80 ක් (රු.මිලියන 10.7 ) ස්කන්ධ ප්‍රාග්ධනය බවට පරිවර්තනය කරන ලද අතර ප්‍රධාන හෝටලය පිහිටා තිබෙන ඉඩම එච්.ඩී.එල්. ආයතනයට දීර්ඝකාලීන බදු ක්‍රමය යටතේ පවරා එම බදුකරයේ වටිනාකම (රු.මිලියන 7 ) එහි ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස පරිවර්තනය කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2013 වසරේදී එච්.ඩී.එල් සමාගමේ රජය සතු කොටස් හි ආයෝජන වටිනාකම රු.බිලියන 17.7 කින් වර්ධනය වී ඇත.<br>එමෙන්ම එච්.ඩී.එල් සමාගම විසින් 2013.12.31 දිනට ගෙවිය යුතුව තිබූ ඉතිරි ණය මුදල වන රු. බිලියන 2.35 ද ස්කන්ධ ප්‍රාග්ධනය බවට පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.<br>හෝටලයේ මෙහෙයුම් කටයුතු අඩ වශයෙන් නතර කිරීමේ පදනමින් 2013 වසරේ සිට සමාගම විසින් හිල්ටන් හෝටලය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය 2015 වසරේ දෙසැම්බර් මස අවසන් කිරීමට අපේක්ෂිත අතර ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය ඇ.ඩො.මිලියන 35 කි. මින් ඇ.ඩො.මිලියන 27 ක් හවුල් ණයක් ලෙස ලබා ගැනීමට නියමිත අතර ඉතිරිය සමාගමේ ඉපැයීම් වලින් යෙදවීමට අපේක්ෂිතය. | සංචාරක සංඛ්‍යාවේ වර්ධනයට සමානුපාතිනව සාම්ප්‍රදායික සංචාරක අත්දැකීම් වලින් බැහැර වෙමින් විවිධත්වයෙන් යුත් නවමු හා අසමසම සංචාරක අත්දැකීම් පිරිනැමීම කෙරෙහිත් අවධානය යොමු කිරීම. |
| | **ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය**<br>සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් ප්‍රධාන සංචාරක කලාප ආශ්‍රිතව ලක්සල ප්‍රදර්ශනාගාර 6 ක් ඉදි කිරීමට කටයුතු කර ඇත. | සංචාරක කර්මාන්තය වැඩි වශයෙන් ප්‍රචලිත ප්‍රදේශවල වෙළෙඳ කුටි ඇති කිරීම තුළින් සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයේ වාසිය උපරිම වශයෙන් ලබා ගැනීමට අවශ්‍ය උපාය මාර්ග සැකසීම. |
| | **සීමාසහිත ලංකා සතොස**<br>නව වෙළෙඳසැල් 20ක් විවෘත කිරීම හා තෝරාගත් අත්‍යාවශ්‍ය භාණ්ඩ අඩු මිලට සැපයීම හේතුවෙන් 2013 වසරේදී ලංකා සතොස ආයතනයේ විකුණුම් ආදායම 22%කින් වර්ධනය කිරීමට හැකියාව ලැබී ඇත.<br>තවද, දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණයෙන් බදුල්ල, නුවරඑළිය, හා යාපනය දිස්ත්‍රික්කවල ගොවීන්ගේ අල, ළූණු සහ මිරිස් නිෂ්පාදිත ස්ථාවර මිලකට ලබා ගැනීමට කටයුතු කර ඇත. | ගිණුම්කරණ ක්‍රියාවලිය ඇතුළු සියළුම මෙහෙයුම් ක්‍රියාකාරකම් ඒකාබද්ධ කරමින් ආයතනික සම්පත් සැලසුම් කිරීමේ පද්ධතියක් (ERP) සකස් කිරීමේ කටයුතු අවසාන කිරීම. වෙළෙඳපොළ කොටස ඉහළ නැංවීම සඳහා සුදුසු උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීම. |
| | **ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව**<br>නිෂ්පාදන කළඹ විවිධාංගීකරණය කිරීම හා සංස්ථානාමය යටතේ නව වෙළෙඳනාම හඳුන්වාදීම හේතුවෙන් 2013 වසරේදී ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ ආදායම 30%කින් වර්ධනය වී ඇත. මේ හේතුවෙන් 2013/14 මූල්‍ය වර්ෂයේදී ලාභය රු. මිලියන 157ක් දක්වා වර්ධනයවූ අතර පෙර වර්ෂයේදී එම ලාභය රු.මිලියන 97කි. තම නිෂ්පාදන සඳහා වන දැඩි වෙළෙඳපොළ | පාරිභෝගික පදනම රාජ්‍ය අංශය වෙත පමණක් සීමා නොකර පුද්ගලික අංශයේ පාරිභෝගිකයන් ඉලක්ක කර ගනිමින් වෙළෙඳපොළ කොටස වර්ධනය කර ගැනීම.<br>සුදුසු වෙළෙඳපොළ වෙත නිෂ්පාදන හඳුන්වාදීම ප්‍රචලිත කිරීම සහ සන්නාම නාම ප්‍රවර්ධනය සඳහා සුදුසු ක්‍රමවේදයන් හඳුන්වාදීම. |

| | | |
|---|---|---|
| | තරඟකාරීත්වයට මුහුණ දෙන අතරම විශේෂිත පාරිභෝගික අවශ්‍යතා ඉලක්ක කොටගත් වෙළෙඳපොළ (niche market) සඳහා ඉදිරිපත් කළ හැකි භාණ්ඩ හඳුනා ගැනීමත් එම වෙළෙඳපොළ තුළ තම සන්නම් නාමය ප්‍රචලිත කිරීමත් ඉදිරි වර්ධනය සඳහා ගත යුතු අත්‍යාවශ්‍ය පියවර බවට හඳුනා ගනු ලැබ ඇත. | |
| | **රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව**<br>2013 වසරේදී, මුළු ආදායම 7%කින් වර්ධනයවූ අතර එය රු.මිලියන 1,308ක් වූ අතර 2012 වසරේදී මුළු ආදායම රු.මිලියන 1,219කි. මෙයට සමගාමීව මෙහෙයුම් වියදම් 9%කින් වැඩිවී ඇති අතර, 2012දී රු. මිලියන 1,079ක් වූ මෙහෙයුම් වියදම 2013දී රු.මිලියන 1,176ක් වූ අතර මේ සඳහා මූලිකවම හේතු සාධකයවී ඇත්තේ සේවක සුභ සාධක වියදම් වල වැඩිවීමයි. මේ හේතුවෙන් බදු පෙර ලාභය 6%කින් එනම් රු.මිලියන 132 කින් අඩුවී ඇත. | ධාරිතා උපයෝජනය පුළුල් කිරීම සහ පිරිවැය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට උපාය මාර්ග යෙදීම.<br>ගනුදෙනුවල විනිවිදභාවය නිරූපනය කිරීම සඳහා ක්‍රමවේදයන් හා පද්ධති ස්ථාපිත කිරීම. |
| | **රාජ්‍ය දැව සංස්ථාව**<br>අඩි 5000 කට වඩා වැඩි උන්නතාංශයක විහිදී ගිය ගස් කපා ඉවත් කිරීම සම්බන්ධයෙන් පනවන ලද සීමාවන් හේතුකොටගෙන 2013 වසරේදී රාජ්‍ය දැව සංස්ථාවේ මුළු ආදායම රු. මිලියන 3,564 සිට රු. මිලියන 3,211 දක්වා සියයට 10 කින් පමණ අඩු විය.<br>එනෙකුදු වුවද විකුණුම් පිරිවැය සියයට 2 කින් අඩු වීමත් සමගම බදු පෙර ලාභය සියයට 68 කින් වර්ධනය කර ගැනීමට රාජ්‍ය දැව සංස්ථාව 2013 වසරේදී සමත්ව ඇත. | විදේශීය වෙළෙඳපොළ අපනයන අවස්ථාවන්ද ඇතුළුව ගුණාත්මක බවින් ඉහළ ගෘහ භාණ්ඩ සඳහා විශේෂිත පාරිභෝගික අවශ්‍යතා ඉලක්ක කොටගත් වෙළෙඳපොළ (niche market)අවස්ථාවන් උකහාගත හැකි වන පරිදි ගෘහ භාණ්ඩ නිෂ්පාදනයේදී උපාය මාර්ගික සහයෝගිතාවන් ගොඩනැඟීම.<br>අගය එකතු කල, පරිසර හිතකාමී ගෘහභාණ්ඩ නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමු කිරීම.<br>උපරිම දැව පරිමාවක් ලබා ගැනීම සඳහා දැව කඳන් හෙළීමේදී සිදුවන නාස්තිය හැකිතරම් අවම කිරීමට කටයුතු යෙදීම.<br>රාජසන්තක කරන ලද අනවසර දැව දිරාපත්ව නිෂ්ප්‍රයෝජන තත්ත්වයට පත්වීමට පළමුව සංස්ථාවේ භාරයට ගැනීම සඳහා අදාළ නීතිමය රාමුව තුළ කඩිනම් පියවර ගැනීම. |
| පොහොර | **සීමාසහිත ලංකා පොහොර සමාගම**<br>රජය විසින් ලබා දෙන පොහොර සහනාධාර ප්‍රමාණය අඩුවීම හේතුවෙන් 2012/13 වසරේදී ලංකා පොහොර සමාගම විසින් බෙදා හරින ලද පොහොර මෙ.ටොන් 281,000 2013/14 වසරේදී පොහොර මෙ. ටොන් 199,000 දක්වා 29% කින් පහත වැටී ඇත.<br>කෙසේ වෙතත්, 2012/13 වසර තුළදී ලංකා පොහොර සමාගමේ බදු පෙර ලාභය රු. මිලියන 215 දක්වා වර්ධනය වී ඇත. 2014/15 වසර තුළදී අනෙකුත් බෝග සඳහා බෙදා හරින පොහොර ප්‍රමාණය මෙ. ටොන් 48,000 සිට මෙ. ටොන් 107,000 දක්වා වර්ධනය කිරීමට අපේක්ෂිතය.<br><br>**සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම**<br>2013/14 මූල්‍ය වර්ෂය තුළදී සීමාසහිත | වෙළෙඳපොළ පොහොර හිඟතාවයන් හා ගබඩාවල පොහොර අතිරික්තයන් මඟ හැරෙන පරිදි සහනාධාර සඳහා වන පොහොර බෙදා හැරීම<br>මනා ප්‍රසම්පාදන සැලැස්මක් සහ තොග පාලන ක්‍රමවේද හඳුන්වා දීම. |

| | | |
|---|---|---|
| | කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ මුළු ආදායම හා ලාභය පිළිවෙලින් රු.මිලියන 1,056ක් හා රු.මිලියන 137ක් දක්වා වර්ධනයවී ඇත. පෙර වසරට සාපේක්ෂව ලාභය 879%ක වර්ධනයක් පෙන්නුම් කරයි.<br>දකුණු සහ නැගෙනහිර පළාත්වල ගොවීන්ට හිඟයකින් තොරව පොහොර බෙදාහැරීම සඳහා හම්බන්තොට ප්‍රදේශයේ පොහොර ගබඩාවක් විවෘත කිරීමට කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සැලසුම්කර සිටී. මෙමගින් 2014/15 වසරේදී බෙදාහැරීමේ වියදම අඩුකර ගැනීමටත් ලාභය වැඩිකර ගැනීමටත් අපේක්ෂා කෙරේ. | |
| රක්ෂණය | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමට මූලික පියවරයන් ගන්නා ලද අතර බඳවා ගැනීම් සම්බන්ධ ගැටළු, ප්‍රසම්පාදන සහ මානව සම්පත් ආශ්‍රිත ගැටළු සහ ඉහළ කළමනාකාරීත්වය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධ සාකච්ඡාවට ගණනාවක් පවත්වා ඇත.<br><br>2013 මැයි මස සිට ආරම්භ කිරීමට නියමිත වූ 2013 අයවැය යෝජනා හා සමගාමීව භෝග රක්ෂණ යෝජනා ක්‍රමය හඳුන්වාදීම සඳහා පහසුකම් සැලසීම. කෘෂිකාර්මික හා ගොවි රක්ෂණ මණ්ඩලය සමඟ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය නැවත පිහිටුවීම සඳහා මූලික පියවරයන් ගැනීම. | ආර්ථිකයේ නොපිවිසුන ක්ෂේත්‍රයන්ට පිවිසීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කරමින් රක්ෂණ සමාගම් වල ධාරිතාවය වැඩිකිරීම හා කේන්ද්‍රගත කිරීම.<br>ජීවිත රක්ෂණ අංශය සඳහා සාම්ප්‍රදායිකව විශ්වාසය තැබූ බෙදාහැරීමේ නියෝජිතයින් වෙනුවට විකල්ප බෙදාහැරීමේ ජාලයන් යොදාගැනීම අවශ්‍ය වේ.<br><br>විවිධාංගීකරණය/නම්‍ය නිෂ්පාදිතයන් වැනි විකල්ප ආකාරයේ තරඟකාරීත්වයක් වඩාත් හොඳ ප්‍රතිරක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. |
| පශු සම්පත් | මිල්කෝ ආයතනය දරා ඇති විශාල පාඩුව අඩු කර ගැනීම සඳහා කිරි නිෂ්පාදනයන් වල මිල ගණන් සංශෝධනය කිරීමට අවශ්‍ය පහසුකම්/සහයෝගය ලබා දෙන ලදී.<br><br>ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ඉහල ඵලදායිත්වයෙන් යුත් කිරි එළදෙනුන් ප්‍රමාණය වැඩිකර ගැනීම සඳහා අවශ්‍ය ඇමරිකානු ඩොලර් මිලියන 12.5 ක ණයක් ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දෙන ලදී.<br><br>අඹේවල,දිගන හා පොලොන්නරුවේ පිහිටා ඇති මිල්කෝ කර්මාන්තශාලා 3 නවීකරණය කිරීම සඳහා අවශ්‍ය යුරෝ මිලි. 33.8 ක ණයක් ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දෙන ලදී. | දියර කිරි සඳහා වන මෙතෙක් ඇති නොවූ ඉල්ලුමෙන් ප්‍රයෝජන ගැනීම සඳහා වෙළෙඳපොළ නියෝජිතයන් ධෛර්යමත් කිරීම හා දියර කිරි භාවිතය ප්‍රවර්ධනය කිරීම.<br>කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන වෙළෙඳපොළ විධිමත් කිරීම සඳහා සාම්ප්‍රදායික හා අවිධිමත් වෙළෙඳපොළ හඳුනා ගැනීම සහ සුදුසු කාර්යක්ෂම වෙළෙඳපොළ ක්‍රමවේදයන් හා තාක්ෂණයන් ඒ සඳහා හඳුන්වාදීම.<br>තත්ත්ව පාලනය වැඩිදියුණු කිරීම හා මහජන සෞඛ්‍ය සඳහා වන අවධානම හඳුනා ගැනීම සඳහා සුදුසු පියවර ගැනීම. |
| වැවිලි | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් තුමාගේ සභාපතිත්වයෙන්, ප්‍රදේශීය වැවිලි සමාගම් (ප්‍රා.වැ.ස.) වලට අදාලව අනුමැතියට ඉදිරිපත් කර ඇති උප බදු දීමේ ඉල්ලීම් හා 2014 අයවැය යෝජනා සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් වලට අදාල අනෙකුත් ගැටළු සාකච්ඡා කිරීමට රන් කොටස් කරුවන්ගේ රැස්වීම් පැවැත්විය.<br>දිගුකාලයක් නොපියවා පවතින ව්‍යවස්ථාපිත ගෙවීම් නිරවුල් කිරීමට රජයට අයත් වැවිලි ආයතන (ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව, ජනතා වතු | නිෂ්පාදන පිරිවැය අඩුකිරීමට හා අස්වැන්න වැඩි කිරීම සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම.<br>අවශ්‍ය අවස්ථාවන් වලදී නව තාක්ෂණය හා ප්‍රාග්ධනය යෙදවීම,කර්මාන්තයේ වෙනස්වීම් වලට ගැලපෙන ලෙස නවීන තාක්ෂණය යොදා ගැනීම<br>කාර්යය සාධනය හා නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා ඵලදායී කළමනාකරණ උපාය මාර්ග සැකසීම<br>අමුද්‍රව්‍ය නිෂ්පාදන වෙනුවට ඉහළ එකතු කළ |

| | | |
|---|---|---|
| | සංවර්ධන මණ්ඩලය හා ඇල්කඩුව වැවිලි සමාගම) සතු වාණිජමය වටිනාකමක් සහිත දැව කැපීමට නිර්දේශ කිරීම හා ඉන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම සඳහා එම ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම. | අගයක් සහිත නිෂ්පාදන වෙත යොමු වීම තේ නිෂ්පාදන වල ගුණත්වය ඉහළ නැංවීමටත් මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත් හැකිවන පරිදි අමු තේ සැකසීම සඳහා නව ස්වයංක්‍රීය යාන්ත්‍රික පද්ධතීන් හඳුන්වාදීම.<br>දේශීය හා විදේශීය තේ නිෂ්පාදනකරුවන් අතර තරඟකාරීත්වය පවත්වා ගැනීම සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව දැනුම හා පුහුණුව ලබාදීම<br><br>නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී නැවත වගා කිරීම වේගවත් කිරීම. |
| පුනර්ජනනීය නොවන සම්පත් | පුනර්ජනනීය නොවන සම්පත් කර්මාන්තය ප්‍රාග්ධන ආයෝජන මත පදනම් වූ කර්මාන්ත බැවින් සම්පත් නිස්සාරණය සඳහා වැඩිපුර මූල්‍ය පහසුකම් අවශ්‍ය වේ.ඉදිරි මූල්‍ය පහසුකම් සැපයීමට අදාළව ඉදිරිපත් වූ ඇමති මණ්ඩල සංදේශ සඳහා නිර්දේශ මෙන්ම ව්‍යාපෘති ඇගයීම් සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙන ලදී.<br><br>වාර්ෂික මහා සභා රැස්වීම් සඳහා සහභාගී වී රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය ඇති කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් ලබා දුන් අතර ලාභාංශ ගෙවීමේදී ඇතිවන බදු සංතුලතා පෙන්වා දෙන ලදී. | නිෂ්පාදන පිරිවැය හා නාස්තිය අවම කිරීම සඳහා නිසි මූල්‍ය කළමනාකරණ ක්‍රමවේදයන් හඳුන්වාදීම.<br>තොග එකතු වීම මඟහරවා ගැනීම සඳහා නිසි අලෙවි කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.<br>අගය එකතු කළ නිෂ්පාදනයන් අපනයනය සඳහා වැඩි අවධානයක් යොමු කිරීම. |
| සෞඛ්‍යය | **ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**<br><br>ආයුර්වේදීය නිෂ්පාදන සඳහා වන ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මහල් හතරකින් යුතු ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලදි. | ඖෂධීය පැලෑටි ආශ්‍රිත නිෂ්පාදන හා ආයුර්වේද ඖෂධ සඳහා සංචාරක කලාපයන් ඇතුළු වෙළෙඳපොළ ඉල්ලුම වැඩි කිරීම සඳහා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br><br>ඖෂධීය වගාවන් වැඩිදියුණු කිරීම |
| | **රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**<br><br>සෞඛ්‍ය අංශයට අවශ්‍ය වන ඖෂධ අඛණ්ඩව සැපයීම සඳහා ඖෂධ නීතිගත සංස්ථාව වෙත චක්‍රීය ණය පහසුකම් සපයන ලදී. | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවන්ට අනුකූලව ඖෂධ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම<br>ප්‍රසම්පාදන කළමනාකරණය බෙදාහැරීම් සහ ගබඩාකරණ ක්‍රමවේද වැඩිදියුණු කිරීම තුලින් ද්‍රවශීලතා දුෂ්කරතාවයන් අවම කිරීම.<br>වානිජමය ශක්‍යතාවය සහතික කිරීම පිණිස වෙළඳපොළ කොටස වර්ධනය කිරීම. |
| | **රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**<br><br>සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට සහ පුද්ගලික අංශයට අඛණ්ඩව ඖෂධ සැපයීම සඳහා ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත චක්‍රීය පහසුකම් සැපයීම හා ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ගිණුම්කරණ අත්පොත සකස්කිරීම සඳහා සහායවිය. | සියළුම රජයේ රෝහල්වල ඖෂධ අවශ්‍යතාවන්ට සරිලන පරිදි රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාවය හා නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම. |
| | **ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල**<br><br>පස්වරුවේ රෝහල් සේවාවන් පැවැත්වීම සඳහා නිර්දේශ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පොදු කාරක සභාවට ලබාදීම හා ඒ අනුව අදාල සේවාවන් ආරම්භ කිරීම. ආයතනයේ | පෞද්ගලික වැනල් සේවා පුළුල් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සැකසීම හා මුදල් ගෙවන වාට්ටු සඳහා වැඩි සේවාලාභීන් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රවර්ධන ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම.රෝහලේ විශේෂ ඒකක සඳහා |

| | | |
|---|---|---|
| | කාර්යසාධනය සාකච්ඡාකිරීම සඳහා සභාපතිගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා පැවැත්වීම. | උපකරණ නවීකරණය කිරීම හා භෞතික වැඩිදියුණු කිරීම් සිදුකිරීම.<br>ඉහළ ලාභාන්තිකයක් ලබා ගැනීම උදෙසා විශේෂ වාට්ටුවල මිලකරණයන් සියලුම වෛද්‍ය සහායක සේවා සැපයීමට හැකි පරිදි වැඩි දියුණු කිරීම. |
| මාධ්‍ය | **ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව**<br>නව VHF FM සංඛ්‍යාත වෙනස් කිරීමේ සැලැස්ම සඳහා සහ ස්වයංක්‍රීය සම්බන්ධකරන පද්ධතිය වැඩිදියුණු කිරීම උදෙසා මහනුවර නාලිකාව වෙත ප්‍රතිපාදන ලබාදීම, ත්‍රිකුණාමල අයිබලැති ගුවන්විදුලි මධ්‍යස්ථානයක් ගොඩනැංවීම සඳහා වූ ව්‍යාපෘතියට ප්‍රතිපාදන ලබාදීම.<br>**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව**<br>ජාතික අවශ්‍යතාවන් පිළිබඳ සලකා බලා නාලිකා 1 සහ චැනල් අයි නාලිකාව වෙනුවෙන් රු.මි 500 දක්වා ආයෝජනය කිරීමට අනුමැතිය ලබාදෙන ලදි. | තරඟකාරීත්ව වාසි ලබා ගැනීම උදෙසා මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ගුණාත්මය වැඩි කරන උසස් ඩිජිටල් තාක්ෂණය වෙත විතැන්වීම සඳහා යටිතල පහසුකම් හා මානව සම්පත් වැඩිදියුණු කිරීමට අවශ්‍ය උපාය මාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීම.<br>ඉහළ ගුණාත්වයෙන් යුත් වැඩසටහන් යොදා ගනිමින් විවිධාංගීකරණය වූ පාරිභෝගික පිරිස වර්ධනය කර ගැනීම තුළින් වෙළෙඳපොළ කොටස වර්ධනය කර ගැනීම. |
